# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
# உள்நாட்டு இறைவரித் திணைக்களம்
# INLAND REVENUE DEPARTMENT

ලේකම් අංශය
14 වන මහල
දේශීය ආදායම් ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැ.පෙ. 515, කොළඹ 2- ශ්‍රී ලංකාව

செயலகம்
14வது மாடி
உள்நாட்டு இறைவரிக் கட்டிடம்
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை
த.பெ.இல ,515 .கொழும்பு- ,2இலங்கை

Secretariat
14th Floor
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawatha
P.O. 515, Colombo 2 - Sri Lanka

ෆැක්ස් / பக்ஸ் / Fax: 011 - 2338574/ 2338659/ 2338635/ 2338570/ 2338543

දුරකථන / தொலைபேசி / Telephone: 011- 2135300/ 2135410/ 2135412 /2135413

E-Mail : cgir@ird.gov.lk
Web: www.ird.gov.lk


**SEC/2022/E/05** **2022.12.22**

**<u>සේවා නියුක්ති ආදායම ගණනය කිරීමේ දී මූල්‍යමය නොවන ප්‍රතිලාභ සඳහා වටිනාකම ප්‍රමාණනය කිරීම</u>**

2022/2023 තක්සේරු වර්ෂයේ දෙවන තුන්-මාසික කාලපරිච්ඡේදය සඳහා සේවා නියුක්තියක් මගින් සේවා නියුක්තිකයකුගේ ලැබීම් සහ ලාභ ගණනය කිරීමේ දී සේවා නියුක්තිය මගින් එවැනි සේවා නියුක්තිකයකු ලබන හෝ උපයන මූල්‍යමය නොවන ප්‍රතිලාභ, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 27 වන වගන්තිය ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් පහත පරිදි විශේෂයෙන් සඳහන් කර ඇත.

1. *සේවායෝජකයා විසින් ප්‍රදානය කළ සමාගම් කොටස්වල වටිනාකම*

ඕනෑම කොටසක් විභජනය කිරීමේ හෝ ඕනෑම කොටසක් අත්පත් කර ගැනීමට මනාපයක් ප්‍රදානය කිරීමෙන් සේවායෝජකයාගේ ඕනෑම සේවා නියුක්තිකයෙකුට උපචිත වන ඕනෑම ප්‍රතිලාභයක වටිනාකම යන්නෙන්, අතිරික්තයක් තිබේ නම් අවස්ථාවෝචිත පරිදි සේවා නියුක්තිකයින් උදෙසා වූ යෝජනා ක්‍රමයක් යටතේ විභජනය කරන ලද කොටස්වල ඒ විභජනය කරන ලද අවස්ථාවේ වෙළඳපොළ වටිනාකමෙන් එම කොටස් සඳහා සේවා නියුක්තිකයාගේ දායක මුදල අඩු කළවිට ලැබෙන වටිනාකමයි.

2. *සේවායෝජකයෙකු විසින් සපයන ලද ඕනෑම වාසස්ථානයකින් වන ප්‍රතිලාභවල වටිනාකම*

(i) වෙළඳපොළ වටිනාකම නිශ්චය කරගත නොහැකි අවස්ථාවක දී සේවායෝජකයෙකු විසින් සපයා ඇති ඕනෑම වාසස්ථානයක ඕනෑම ප්‍රතිලාභයක "වටිනාකම" යනු අවස්ථාවට අදාළ වන පරිදි වෙළඳපොළ වටිනාකම හෝ පහත නිශ්චය කර ඇති වටිනාකම විය යුතුය.

| **මාසික පාරිශ්‍රමිකය** | **මාසික මූල්‍ය නොවන ප්‍රතිලාභ (රු.)** | | |
|---|---|---|---|
| | **වරිපනම් බදු ගෙවන ප්‍රදේශ** | **වරිපනම් බදු නොගෙවන ප්‍රදේශ** | **වතු බංගලා** |
| 200,000 ට අඩු හෝ සමාන වන්නේ නම් | 20,000 හෝ පාරිශ්‍රමිකයෙන් 12.5% යන දෙකින් කවර හෝ අඩු අගය | 15,000 හෝ පාරිශ්‍රමිකයෙන් 10 % යන දෙකින් කවර හෝ අඩු අගය | 10,000 හෝ පාරිශ්‍රමිකයෙන් 7.5% යන දෙකින් කවර හෝ අඩු අගය |
| 200,000 ට වැඩි වන්නේ නම් | 40,000 හෝ පාරිශ්‍රමිකයෙන් 12.5% යන දෙකින් කවර හෝ අඩු අගය | 30,000 හෝ පාරිශ්‍රමිකයෙන් 10 % යන දෙකින් කවර හෝ අඩු අගය | 20,000 හෝ පාරිශ්‍රමිකයෙන් 7.5% යන දෙකින් කවර හෝ අඩු අගය |
| ගෘහභාණ්ඩ සපයා තිබේ නම් | පාරිශ්‍රමිකයෙන් 2.5% හෝ 5,000 යන දෙකින් කවර හෝ අඩු අගය | | |

වාසස්ථානයක වටිනාකම යන්නට එහි ආරක්ෂාව, ගෘහ සේවිකාවන්, වැඩකරුවන්, රෙදි සේදීම යනාදිය ඇතුළත් ලෙස සැළකිය යුතුය.

***සටහන:*** *ඕනෑම ප්‍රතිලාභයක වටිනාකම සාධාරණ වෙළඳපොළ වටිනාකමට වඩා අඩු වන අවස්ථාවක දී සේවා නියුක්තිකයාගේ සේවා නියුක්තික ආදායම වන බදු කාර්යය සඳහා සලකනු ලබන ප්‍රතිලාභ සහ සාධාරණ වෙළඳපොළ වටිනාකම අතර වෙනස 10 වන වගන්තියේ කාර්යයක් සඳහා ගෘහස්ථ වියදමක් ලෙස ඉඩ නොදිය යුතුය.*

(ii) සේවා නියුක්තිකයා පදිංචි වී සිටින නිවසක් හෝ මහල් නිවාසයක් සම්බන්ධයෙන් වන ඕනෑම වියදමක් සේවායෝජකයා විසින් ප්‍රතිපූරණය කරන විට ප්‍රතිලාභයේ වටිනාකම සේවායෝජකයා විසින් ප්‍රතිපූරණය කරන ලද සත්‍ය වියදම විය යුතුය.

*3. සේවායෝජකයා විසින් සපයන ප්‍රවාහන පහසුකම්වල වටිනාකම*

(i) යම් මෝටර් රථයක් පෞද්ගලික පාවිච්චිය (සම්පූර්ණ හෝ කොටසක්) මගින් සේවා නියුක්තිකයෙකු ලබන ප්‍රතිලාභයේ වටිනාකම වෙළඳපොළ වටිනාකම විය යුතු අතර වෙළඳපොළ වටිනාකම නිශ්චය කරගත නොහැකි අවස්ථාවල පහත දක්වා ඇති වටිනාකම් අදාළ කර ගත යුතුය.

| එංජිම | මූල්‍යමය නොවන ප්‍රතිලාභ (මසකට රු. වලින්) | | |
|---|---|---|---|
| | වාහනය | රියදුරු | තෙල් |
| • 1800 cc ට නොවැඩි - තෙල් හෝ දෙමුහුම් (පෙට්‍රල්/ඩීසල්)<br>• 200 KW ට නොවැඩි විදුලි රථ | 20,000 | 10,000 | 20,000 |
| • 1800 cc ට වැඩි - තෙල් හෝ දෙමුහුම් (පෙට්‍රල්/ඩීසල්)<br>• 200 KW ට වැඩි විදුලි රථ | 35,000 | 10,000 | 30,000 |

රාජකාරී හෝ පෞද්ගලික පාවිච්චිය සඳහා වාහන එකකට වඩා වැඩි සංඛ්‍යාවක් සපයා ඇත්නම්, එක් වාහනයක් පෞද්ගලික පාවිච්චිය සඳහා සේවා නියුක්තියෙන් ලද ප්‍රතිලාභයක් ලෙස සළකා, අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (අ.පු.ආ.බ.) කාර්යය සඳහා කටයුතු කළ යුතුය.

***සටහන:*** *ඕනෑම ප්‍රතිලාභයක වටිනාකම සාධාරණ වෙළඳපොළ වටිනාකමට වඩා අඩුවන අවස්ථාවක දී සේවා නියුක්තිකයාගේ සේවා නියුක්තික ආදායම මත බදු කාර්යය සඳහා සලකනු ලබන ප්‍රතිලාභ සහ සාධාරණ වෙළඳපොළ වටිනාකම අතර වෙනස 10 වන වගන්තියේ කාර්යයන් සඳහා ගෘහස්ථ වියදමක් ලෙස ඉඩ නොදිය යුතුය.*

(ii) යම් මෝටර් බයිසිකලයක් පෞද්ගලික පාවිච්චිය (සම්පූර්ණ හෝ කොටසක්) මගින් සේවා නියුක්තිකයාට ලැබෙන ප්‍රතිලාභවල වටිනාකම-

(අ) එකී යෝජකයාගේ ගිණුම මත තෙල් සමග සේවායෝජකයා විසින් සපයන අවස්ථාවක දී මසකට රු.5,000 ක් ලෙස සැළකිය යුතුය. (එන්ජින් ධාරිතාව නොසළකා);

(ආ) සේවායෝජකයා විසින් තෙල් රහිතව සපයනු ලබන අවස්ථාවක දී මසකට රු.3,000 ක් ලෙස සැළකිය යුතුය. (එන්ජින් ධාරිතාව නොසළකා)

(iii) පෞද්ගලික පාවිච්චිය මගින් ප්‍රතිලාභවල වටිනාකම –

(අ) ක්ෂේත්‍ර රාජකාරි සඳහා පාවිච්චි කිරීමට සේවායෝජකයා විසින් සපයා ඇති ඕනෑම මෝටර් වාහනයක, එහි පාවිච්චිය වෙනුවෙන් සේවායෝජකයා විසින් නිවැරදි වාර්තා පවත්වාගෙන යනු ලබන අවස්ථාවක කිලෝමීටරයකට රු.25 ක් ලෙස සැළකිය යුතුය. (වාහනයේ එන්ජින් ධාරිතාව නොසළකා);

(ආ) සේවායෝජකයා විසින් සපයා ඇති ඕනෑම මෝටර් බයිසිකලයක් එහි පාවිච්චිය වෙනුවෙන් නිවැරදි වාර්තා සේවායෝජකයා විසින් පවත්වාගෙන යනු ලබන අවස්ථාවක දී කිලෝමීටරයකට රු.5 ක් ලෙස සැළකිය යුතුය. (වාහනයේ එන්ජින් ධාරිතාව නොසළකා);

(iv) සේවා නියුක්තිකයා විසින් හිමිකාරිත්වය දරන මෝටර් වාහනයක හෝ මෝටර් සයිකලයක තෙල් හෝ නඩත්තුව සම්බන්ධයෙන් වන යම් වියදමක් සේවායෝජකයා විසින් දරන ලද හෝ ප්‍රතිපූරණය කරන අවස්ථාවක දී සේවා නියුක්තිකයාට ලැබෙන ප්‍රතිලාභවල වටිනාකම, සත්‍ය වියදම විය යුතුය.

*4. සේවායෝජකයා විසින් සපයා ඇති අනිකුත් ප්‍රතිලාභ*

| | ප්‍රතිලාභයේ ස්වභාවය | ප්‍රතිලාභයේ වටිනාකම |
|---|---|---|
| 1 | විදේශිකයින් සඳහා හෝටල් පහසුකම් සැපයීම | පිරිවැයෙන් 100% ක් |
| 2 | සහනදායී අනුප්‍රමාණ මත ණය | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් වාර්ෂිකව නිශ්චය කරනු ලබන සහනදායී අනුප්‍රමාණ සහ වෙළඳපොළ අනුප්‍රමාණ අතර 50% ක වෙනස ද, 2022/2023 තක්සේරු වර්ෂයේ දෙවන තුන්-මාසික කාලපරිච්ඡේදය සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිශ්චය කරනු ලබන වෙළඳපොළ අනුප්‍රමාණය වර්ෂයකට 9.08% කි. |
| 3 | මෙහෙකරුවන් සැපයීම ආදිය | පිරිවැයෙන් 100% ක් |
| 4 | විදුලිබලය සහ ගෑස් සැපයීම ආදිය | පිරිවැයෙන් 100% ක් |
| 5 | වෛද්‍ය ප්‍රතිලාභ සැපයීම | එවැනි වෛද්‍ය බිල්පත්වලින් 100% ක් |
| 6 | නොමිලේ ආහාර වේල් සැපයීම | පිරිවැයෙන් 100% ක් |
| 7 | දන්ත, වෛද්‍ය හෝ සෞඛ්‍ය රක්ෂණ ගෙවීම දන්ත, වෛද්‍ය හෝ සෞඛ්‍ය රක්ෂණ වියදම් නිදහස් කිරීම හෝ ප්‍රතිපූරණය කිරීම සමාන කොන්දේසි මත සියලුම පූර්ණ කාලීන සේවා නියුක්තිකයන් හට නොමැති අවස්ථාවක දී | පිරිවැයෙන් 100% ක් |
| 8 | දුරකථන බිල්පත් සහ වාර්ෂික ගාස්තු ගෙවීම | පිරිවැයෙන් 50% ක් |
| 9 | ගුවන් ටිකට්පත් (නිල කාර්යයන් හැර) | පිරිවැයෙන් 100% ක් |
| 10 | බදු ගෙවීම | ගෙවූ බදු මුදල |

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

**එච්.ආර්.එස්. හපුආරච්චි**
**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**
**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**
**සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත**
**කොළඹ 02.**